සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය | **ක්‍රිස්තියානි ධර්මය I** | කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ''සතුට හා සොම්නස ඔබට ඇතිවේ. මන්ද බොහෝදෙන ඔහුගේ උත්පත්තිය නිමිත්තෙන් ප්‍රීති වන්නාහ.'' මෙසේ බොහෝ දෙනාට සතුට ගෙන දෙන උපත වන්නේ,
    (1) ජේසු උපතයි. (2) ස්නාවක ජොහාන් තුමාගේ උපතයි.
    (3) මරියාවන්ගේ උපතයි. (4) සෙකරියස්ගේ උපතයි.

02. ක්‍රිස්තුස් නම් ගැලවුම්කරුගේ ''සලකුණ'' ලෙස දෙව්දූතුන් එඬේරුන්ට සැලකළේ,
    (1) අහසේ පායා තිබූ තාරකාවකි. (2) දෙමාපියන් සමග නැළවෙන බිළිඳෙකි.
    (3) ගව ඔරුවක බහා සිටින බිළිඳෙකි. (4) ගවයින් ළඟින මඩුවකි.

03. ඊශ්‍රායෙල් ජනතාව විසින් ගාබ්‍රියෙල් දේවදූතයා හඳුන්වා දෙනු ලැබුවේ,
    (1) දේව නියෝග ඉටුකරන්නෙකු ලෙසය. (2) අනාවැකි පවසන්නෙකු ලෙසය.
    (3) ජනතාව මෙහෙයවන්නෙකු ලෙසය. (4) සුභ පණිවිඩ ගෙන එන්නෙකු ලෙසය.

04. රෝම පාලනයෙන් පිඩාවට හා අසහනයට පත්ව සිටි ජනතාව තමන් මුදවා ගැනීමට පැමිණෙතැයි අපේක්ෂා කළේ,
    (1) මෙසියස්වරයෙකි. (2) අධිරාජ්‍යයෙකි.
    (3) රජෙකි. (4) පාලකයෙකි.

05. ''මක්නිසාද දෙවියන්වහන්සේට නොකළහැකි කිසිවක් නැත'' ගාබ්‍රියෙල් දේවදූතයා මෙසේ ප්‍රකාශ කරන්නේ,
    (1) ජෝසප්ට ය. (2) සෙකරියස්ට ය. (3) මරියතුමියට ය. (4) එලිසබෙත් තුමියට ය.

06. ''එතුමාණෝ ................................ ද ................................... ද රජකම් කරන සේක.'' යෙසායා දිවැසිවරයා ප්‍රකාශ කරන දිවැස්වැකියට අදාළ ගුණාංග වන්නේ,
    (1) කරුණාවන්තකමෙන් ද, විශ්වාසවන්තකමෙන් ද
    (2) යුක්තියෙන් ද, සමාදානයෙන් ද
    (3) බැහැපත්කමෙන් ද, ධර්මිෂ්ටකමෙන් ද
    (4) යුක්තියෙන් ද, ධර්මිෂ්ටකමෙන් ද

07. ලෝකයේ පව් දුරුකරන දෙවියන්ගේ බැටළු පෝතකයාණෝ ලෙස ජේසුස් වහන්සේව හඳුන්වා දුන්නේ,
    (1) ස්නාවක ජොහාන් විසිනි. (2) ගාබ්‍රියෙල් දේවදූතයා විසිනි.
    (3) සෙකරියස් පූජකතුමා විසිනි. (4) සිමියොන් දිවැසිවරයා විසිනි.

08. ජුදෙව් ජනතාවගේ පිළිගැනීම අනුව දෙවියන් වහන්සේට සන්තකවීමේ බාහිර සංකේතය ලෙස සැලකුවේ,
    (1) ශුද්ධවූ බෞතීස්මයයි. (2) චර්මච්ඡේදනයයි.
    (3) කැපකිරිමයි. (4) ශුද්ධවූ සහභාගිකමයි.

09. A කිසිවෙකුගෙන් බලහත්කාරයෙන් කිසිවක් නොගන්න.
B මනස්තාපනය වූ බව දක්වෙන ලෙස හැසිරෙන්න.
C ආබ්‍රහම් අපේ පියාණෝ යැයි සිතින් කියා නොගන්න.
D අඳනා දෙකක් ඇති අය නැති අයට දෙන්න.
ඉහත ප්‍රකාශන අතුරින් ස්නාවක ජොහාන්තුමා ජුදා ආගමික ජනතාවට ලබාදුන් උපදෙස් පමණක් අඩංගු වරණය වන්නේ,
(1) A සහ C (2) C සහ D (3) B සහ D (4) B සහ C

10. ජුදෙව් නීති පද්ධතියට අනුව ජුබිලි වර්ෂයේදී අනිවාර්යයෙන් සිදුකරනු ලැබුවේ,
(1) ජුබිලිය ප්‍රකාශයට පත්කිරීම. (2) ස්තුති මෙහෙයක් පැවැත්වීම.
(3) වහලුන් නිදහස් කිරීම. (4) අසරණයන්ට උපකාර කිරීම.

11. නාසරෙත් හි ප්‍රකාශනයට විරුද්ධ වූවන්ට ප්‍රතිචාර දක්වීම සඳහා ජේසුස් වහන්සේ යොදාගත් දිවැසිවරුන් දෙදෙනා වන්නේ,
(1) ජෙරමියා හා මීකා ය. (2) යෙසායා හා මලාකි ය.
(3) එලියා හා එලිෂා ය. (4) එලියා හා යෙසායා ය.

12. ජුදා සිනගෝගයේ ප්‍රධාන කාර්යය වූයේ,
(1) ආගමික වත්පිළිවෙත් ඉටුකිරීම. (2) ආගමික දැනුම ලබාදීම.
(3) නමස්කාරය සිදුකිරීම. (4) ධර්ම සාකච්ඡා පැවැත්වීම.

13. A මුල් ගෝලයන් කැඳවීම.
B ජේසුස් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය
C මාරුත දමනය
D කුඩා මෝසෙස් පා කර හැරීම
ඉහත සිද්ධීන් අතුරින් ගෙනසෙරෙත් විල හා සම්බන්ධ සිද්ධීන් පමණක් ඇතුලත් වරණය වන්නේ,
(1) A සහ B (2) A සහ D (3) B සහ D (4) A සහ C

14. ජේසුස් වහන්සේගේ ඉගැන්වීමට අනුව දේව සේවයට කැඳවනු ලැබූවන් ප්‍රීති විය යුත්තේ,
(1) සේවයට තෝරාගත් නිසා ය. (2) ස්වර්ගයේ නම ලියවී තිබෙන නිසා ය.
(3) බොහෝදෙනෙකුගේ ප්‍රසාදය ලැබෙන නිසා ය. (4) ජනප්‍රියවීමට අවස්ථාවක් සැලසෙන නිසා ය.

15. රාජතේජසින් ජෙරුසලමට පිවිසි ජේසුස් වහන්සේ අනාවැකි පලකරමින් හඬා වැළපුනේ,
(1) පෙරුසලමට සිදුවන විපත ගැනය. (2) තමන් විඳින්නට යන දඬුවම ගැනය.
(3) පරිසිවරුන්ගේ විරුද්ධකම ගැනය. (4) ජනතාවගේ මුරණ්ඩුකම ගැනය.

16. ජේසුස් වහන්සේ තමකම සම්පූර්ණයෙන්ම නසාදමූ බව පසක් කරන්නා වූ ප්‍රකාශය වන්නේ,
(1) මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායි යන්න යි.
(2) පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න යන්න යි.
(3) මොවුන් නොදැන කරන වරදට මොවුන්ට කමා වුව මැනව යන්න යි.
(4) ඔබගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි යන්න යි.

17. A පරිසිවරුන් B රජවරුන්
C දිවැසිවරුන් D විනයධරයන්

මෙම ජන කණ්ඩායම් අතුරින් ඊශ්‍රායෙල් ඉතිහාසයේ ආලේපය ලැබූ ජන කණ්ඩායම් වන්නේ,
(1) A සහ B (2) C සහ D (3) B සහ C (4) A සහ D

18. ''ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක.'' මෙසේ ප්‍රකාශ කර සිටියේ,
(1) හිමිදිරියේ ජේසුස් වහන්සේගේ සොහොන වෙත ගිය කාන්තාවන් ය.
(2) එම්මාවුස් ගමට ගිය ක්ලේයොපස් සහ අනෙක් ශ්‍රාවකයා ය.
(3) ජේසුස් වහන්සේගේ ප්‍රේරිතයෙකු වූ තෝමස් ය.
(4) ජෙරුමලමේ රැඳී සිටි ශ්‍රාවක පිරිස ය.

19. ජේසුස් වහන්සේ පාළුකරයේ තමන් වෙත පැමිණි පරීක්ෂාවන්වලදී දසපනතේ ආඥාවක් මගින් පිළිතුරු දෙනු ලැබුවේ,

(1) පළමුවන පරීක්ෂාවට ය. (2) දෙවන පරීක්ෂාවට ය.
(3) තුන්වන පරීක්ෂාවට ය. (4) ඉහත සියල්ලටම ය.

20. අන් අය වෙනුවෙන් වැයවීම ඉස්මතුකර පෙන්වන උපමා කතාව වන්නේ,

(1) යහපත් සාමාරිතයාගේ උපමාවයි. (2) වපුරන්නාගේ උපමාවයි.
(3) අකීකරු පුත්‍රයාගේ උපමාවයි. (4) නැතිවූ කාසිය පිළිබඳ උපමාවයි.

21. විශිෂ්ඨ ගුරුවරයෙකු ලෙස තක්සේරුව ලත් ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ ගැඹුරු ගුණධර්ම පොදු ජනතාවට පිළිගැන්වූයේ,

(1) හෙබ්‍රෙව් භාෂාවෙනි. (2) ලතින් භාෂාවෙනි.
(3) ග්‍රීක භාෂාවෙනි. (4) ඇරමෙයික් භාෂාවෙනි.

22. ''ඉඟපටිය බැඳගත්න, පහන්ද දල්වා තබාගන්න.'' මෙමගින් අනාවරණය කෙරෙන සත්‍යතාවයක් නොවන්නේ,

(1) අපේක්ෂාවෙන් සිටීම ය. (2) සූදානමින් සිටිම ය.
(3) දැනුම්දෙනතෙක් සිටීම ය. (4) අවදිව ඉවසිල්ලෙන් සිටිම ය.

23. සිරෙනියේ සීමොන්ගේ ක්‍රියාකලාපය සුවිශේෂී වන්නේ ඔහු

(1) ජේසුතුමන්ගේ මෘත දේහය භාරගත් බැවිනි.
(2) ප්‍රතික්ෂේපයකින් තොරව තම කැඳවීමට ප්‍රතිචාර දක්වූ බැවිනි.
(3) ජේසුතුමා ළඟින් ඇසුරු කළ කෙනෙකු බැවිනි.
(4) තීරණාත්මක අවස්ථාවක සත්‍යයට සාක්ෂි දරූ බැවිනි.

24. පාවුල් එපීසයේදී කළ දෑ ඇසුරින් අද කිතුනුවන්ට ලබාදෙන පණිවිඩය වන්නේ,

(1) රැකියාවෙන් ඉවත් වුවද නව මාර්ග සෙවීම ය.
(2) මිත්‍යා මත වලින් වැළකී එකම දෙවිඳුන් නැමදීම ය.
(3) අරගල හමුවේ පසුබෑම ය.
(4) නිවැරදි දෑ අනුකරණයට පෙළඹීම ය.

25. ''යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්යමත් කරන්න'' යන කාර්යය ජේසුස් වහන්සේ භාර කළේ,

(1) පේදුරුට ය. (2) සාවුල්ට ය. (3) මෝසෙස්ට ය. (4) ආබ්‍රහම්ට ය.

26. ජුදෙව්වරු නිතර භාවිත කළ ''ශාලොම්'' යන හෙබ්‍රෙව් වචනයෙන් අදහස් වන්නේ,

(1) ප්‍රේමය සමාජගත කිරීම යි. (2) සැමට කරුණාව දක්වීම යි.
(3) සම්පූර්ණ විමුක්තිය යි. (4) සම්පූර්ණ සාමය යි.

27. පාවුළුතුමාගේ ධර්මදූත ගමන්වලදී හමුවන ත්‍රෝවසයේදී සිදුවූ විශේෂ සිදුවීමක් වන්නේ,

(1) අගබස් දිවැසිවැකි පැවසීම යි. (2) යක්ෂාවෙස වූ තරුණියක් සුවවීම යි.
(3) යුතිකස්ට නැවත පණදීම යි. (4) උපන්දා පටන් කොර මිනිසකු සුවවීම යි.

28. ජේසුස් වහන්සේගේ කාලය තුළ කුඩා දරුවන් වරදට පැමිණවීමේ බරපතලකම ගැන ඉගැන්වීමේදී එතුමන් ප්‍රකාශ කළේ එසේ කරන අය

(1) අල්ලා දඬුකඳෙහි ගැසිය යුතු බවයි.
(2) ඉන් වළක්වා ගන්නට ක්‍රියා කළ යුතු බවයි.
(3) ගෙලවටා ඇඹරුම් ගලක් එල්ලා මුහුදට හෙළිය යුතු බවයි.
(4) දරුණු වන සතුන් සහිත කුඩුවකට දැමිය යුතු බවයි.

29. ''ගැලවීම සඳහා චර්මච්ඡේදනය අවශ්‍ය නැත.'' යන නියමය ගනු ලැබුවේ.

(1) අන්තියෝකියේ සභාවයි. (2) ජේරුසලම් මන්ත්‍රණ සභාවයි.
(3) කොරෙන්තියේ සභාවයි. (4) ජුදෙව් මන්ත්‍රණ සභාවයි.

30. පාවුළුතුමා මිනීමරුවෙක් යනුවෙන් සෙනග අතර පැවති අදහස, ලූස්ත්‍රාවේදී මෙන් දේවත්වයෙන් සැලකූ තවත් ස්ථානයක් වන්නේ,

(1) මෝල්ටාවේදී ය. (2) කොරෙන්තියේදී ය.
(3) ඇතන්ස්වලදී ය. (4) සුන්දර වරායේදී ය.

31. ඇතන්ස්හිදී පාවුළුතුමා ස්ථානෝචිත ප්‍රඥාවෙන් ද, නොපසුබට වීර්යයෙන් ද ක්‍රියා කිරීමෙන් පාවුළුතුමා අත්පත් කරගත් දෘශ්‍යමාන ප්‍රතිඵලය වන්නේ,

(1) දෙවියන්, මිනිස් වෙසින් පැමිණ ඇතැයි සැලකීමයි.
(2) පාවුළුතුමාට දේවත්වය ආරූඪ කිරීමයි.
(3) ඇතැන්ස් වැසියන් මිත්‍යා මතවලට එල්ඹ සිටීමයි.
(4) බොහෝ වැසියන් දෙවියන් වහන්සේ අදහා ගැනීමයි.

32. ජේසුස් වහන්සේ නිකදෙමුස්ට පැවසූ ''නැවත ඉපදීම'' නම්

(1) මව් කුසට පැමිණ නැවත උපතක් ලැබීමයි.
(2) පරණ ජීවිතය අමතක කර දැමීමයි.
(3) ආත්මයාණන්ගේ උපකාරීත්වයෙන් ජීවිත හැරීමකට භාජනය වීමයි.
(4) ජලයෙන් බෞතිස්මය ලැබීමයි.

33. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය ජාතිකත්වය, වර්ගවාදය අභිබවා ක්‍රියාත්මක වන ප්‍රේමයක් බව පෙන්වා දීමට කදිම උදාහරණයක් වන්නේ,

(1) ලාසරස් මරණයෙන් උත්ථාන කිරීමයි.
(2) සකෙවුස් පිළිගෙන ඔහුගේ නිවසට යෑමයි.
(3) සමාරිය ජාතික කාන්තාවගෙන් බීමට වතුර ඉල්ලීමයි.
(4) බර්තේමියස්ට සුවය දීමයි.

34. තම සන්තක සියල්ල සාතන් විසින් අහිමි කළත් දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වූයේ,

(1) ජෝබ් ය. (2) ආමෝස් ය. (3) සෙකරියස් ය. (4) සාවුල් ය.

35. කයිසාරියේ සිටි දෙවියන් වහන්සේට නොකඩවා යාච්ඤා කළ රෝම හමුදා නිලධාරියා

(1) යායිරස් ය. (2) කෝර්නේලියස් ය. (3) නිකනෝර් ය. (4) නිකදෙමුස් ය.

36. පරිසිවරුන්ගේ බල කේන්ද්‍රස්ථානය වූයේ,

(1) ජෙරුසලම් දේව මාලිගාව ය. (2) සැන්හෙන්ඩ්‍රික් සභාව ය.
(3) සිනගෝගය ය. (4) එපිස මන්ත්‍රණ සභාව ය.

37. රෝම ගමනේදී කුණාටුවට මුහුණ දුන් පාවුල්ගෙන් පන්නරය ලබන කිතුණුවා ජීවිත අර්බුධවලදී

(1) ප්‍රශ්නවලින් පලා යා යුතුය. (2) ධන සම්පත් පරිහරණය කළ යුතුය.
(3) අර්බුධවල ස්වභාවය හඳුනාගත යුතුය. (4) ඇදහිල්ලෙන් සාක්ෂි දැරිය යුතුය.

38. A - සියල්ල පොදුවේ තබාගැනීම.

B - 3000 ක් ජනතාව කිතුණු සභාවට එක්වීම.

C - අන්‍ය භාෂාවලින් කතා කිරීම.

D - ඊශ්‍රායෙල් වංශයේ ප්‍රබලතාව පහදා දීම.

ඉහත ප්‍රකාශන අතරින් මුල් කිතුණු සභාවේ ලක්ෂණ පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) A හා C ය. (2) B හා C ය. (3) B හා D ය. (4) B හා C ය.

39. ව්‍යවස්ථාව ඉක්මවා යන මනුෂ්‍යත්වයේ වැදගත් බව පරිසිවරුන්ට අවධාරණය කළේ,

(1) සබත් දින අතක් පණනැති මිනිසා සුව කිරීමෙනි.
(2) අන්ධ බර්තෙමියස් සුව කිරීමෙනි.
(3) ශතාධිපතියාගේ දාසයා සුව කිරිමෙනි.
(4) අංශභාග රෝගියා සුව කිරීමෙනි.

40. පළමුවරට ක්‍රිස්තියානි යන නම ශ්‍රාවකයන්ට දෙනු ලැබුවේ,

(1) කොරෙන්තියේ සභාව විසිනි. (2) ගලාතියේ සභාව විසිනි.
(3) අන්තියෝකියේ සභාව විසිනි. (4) එපිසයේ සභාව විසිනි.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය **ක්‍රිස්තියානි ධර්මය II** කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය හඟවනු ලැබූ සංකේත 2 ක් ලියන්න.

(ii) ''මාගේ ගෘහය යාච්ඤාවේ ගෘහයක් යැයි ලියා ඇත. එහෙත් ................................ කර තිබේ.'' මෙහි හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

(iii) දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්ය වර්ග කළ හැකි කාණ්ඩ කීයද? ඒ මොනවා ද?

(iv) ''මාගේ මෑණියොත්, සහෝදරයොත් නම් දෙවියන් වහන්සේගේ වචනය අසා පිළිපදින්නෝ වෙති.'' මෙම ප්‍රකාශය කරනු ලැබුයේ කවුරුන් ද? මෙම ප්‍රකාශයෙන් අවධාරණය කරනු ලබන්නේ කුමක්දැයි නේවා දෙන්න.

(v) ජේසුස් වහන්සේ තම සේවය ගැන ප්‍රථමයෙන් අනාවරණය කළ අවස්ථාව කුමක් ද? ඒ සඳහා එතුමා භාවිතා කළ බයිබල් ග්‍රන්ථය කුමක් ද?

(vi) කිතුණු පවුලක් තුළ දෙමව්පියන් වෙනුවෙන් දරුවන් විසින් ඉටුකළයුතු වගකීම් 2 ක් ලියන්න.

(vii) බහුවිධ සමාජයක වෙසෙන කිතුනුවන් සාමකාමී සහජීවනය උදෙසා කුමක් කළ යුතුද?

(viii) ''සමිදාණන් වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව.'' මෙම ප්‍රකාශය කවුරුන් විසින් කුමන අවස්ථාවක කරන ලද්දේ ද?

(iv) ආමොස් දිවැසිවරයා තම හඬ අවධිකළේ සමාජයේ කුමන තත්වයක් ගොඩනැගීම සඳහා ද?

(x) ඔබගේ පන්ති කාමරයේ ආර්ථික දිළිඳුකමින් පීඩාවට පත්ව සිටින මිතුරකුට ඔබ විසින් ලබාදෙන උපදෙස් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2 x 10 = 20)

(02) (i) යුදෙව් පිරිමි දරුවන්ට වයස අවුරුදු 12 දී හිමි වූ විශේෂ වරප්‍රසාද දෙකක් පෙන්වා දෙන්න. (ලකුණු 02)

(ii) යුදෙව් පාස්කු මංගල්‍යයේ විශේෂත්වය ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) කිතුණු දරුවකු වන ඔබ ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් ලබාගන්නාවූ පන්නරය වාක්‍ය පහකින් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) යුදෙව් සමාජයේ සකෙවුස් පව්කරුවකු ලෙස සැලකුවේ ඇයි? (ලකුණු 02)

(ii) මොහු ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි කියා ජේසුස් වහන්සේ කෙබඳු සබඳියාවකට යොමුවීද? (ලකුණු 03)

(iii) එදිනෙදා ජීවිතයේදී එබට මුණගැසෙන නොමග ගිය අය කවුරුන්දැයි පෙන්වාදී ඔවුන් යහමඟට ගැනීමට ඔබ ක්‍රියාකරන අයුරු ලියා දක්වන්න. (ලකුණු 05)

(04) (i) ජේසුස් වහන්සේ වදාළ ''රන් අණ'' ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) ''රන් අණට'' අනුව ඔබට ලබාදෙන මඟපෙන්වීම් තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) ''දේව වචනය'' ඔබගේ ජීවිතයට ලබාදෙන ශක්තීන්, වාක්‍ය පහක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

(05) (i) ව්‍යසන වර්ග කීයද? ඒ මොනවා ද? (ලකුණු 02)

(ii) අද අප ජීවත්වන සමාජය තුළ විවිධ වහල්කම්වලට ඇද දමන බලවේගයන් සමාජ රටාව තුළ ඇතිවී ඇත. ඒවායින් තුනක් පෙන්වා දෙන්න. (ලකුණු 03)

(iii) ජුදා සමාජය තුළ පැවති තත්වයන් වෙනස් කරමින් ජේසුස් වහන්සේ ක්‍රියා කලාක්මෙන් වර්තමාන සමාජයේ යහපත උදෙසා ඔබට කළ හැකි ක්‍රියාකාරකම් පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

(06) (i) පාවුළුතුමා රෝමයට යැමේ අභිප්‍රාය ඉටුකර ගැනීම සඳහා අධිරාජ්‍යයාගේ විනිශ්චය ඉල්ලා සිටි රජවරුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) තුන්වන ධර්මදූත ගමනේ දී පාවුළුතුමා ඇතුළු පිරිස මුහුණ දුන් විශේෂ සිදුවීම් 3 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) පාවුළුතුමා රෝම ගමනේදී මුහුණ දුන් විශේෂ සිදුවීම් තුළින් සාක්ෂි දරූ ආකාරය කරුණු 5 ක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) පෙරමග දූත සේවාව

(ii) වපුරන්නාගේ උපමා කථාව

(iii) ආමොස් දිවැසිවරයා

(iv) ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා (ලකුණු 5 x 2 = 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 3 ) | 03. ( 4 ) | 04. ( 1 ) | 05. ( 3 ) | 06. ( 4 ) | 07. ( 1 ) | 08. ( 2 ) | 09. ( 4 ) | 10. ( 3 ) |
| 11. ( 3 ) | 12. ( 2 ) | 13. ( 4 ) | 14. ( 2 ) | 15. ( 1 ) | 16. ( 1 ) | 17. ( 3 ) | 18. ( 2 ) | 19. ( 2 ) | 20. ( 1 ) |
| 21. ( 4 ) | 22. ( 3 ) | 23. ( 2 ) | 24. ( 2 ) | 25. ( 1 ) | 26. ( 4 ) | 27. ( 3 ) | 28. ( 3 ) | 29. ( 2 ) | 30. ( 1 ) |
| 31. ( 4 ) | 32. ( 3 ) | 33. ( 3 ) | 34. ( 1 ) | 35. ( 2 ) | 36. ( 3 ) | 37. ( 4 ) | 38. ( 1 ) | 39. ( 1 ) | 40. ( 2 ) |

(ලකුණු 1 x 40 = 40)

## II පත්‍රය

01 (i) සැඩ සුළඟ, ගිනි දළු
(ii) ඔබ එය හොරුන්ගේ ගුහාවක්
(iii) හතරයි. - සුව කිරීම් / ස්වභාව ධර්මය අභිබවා කළ ක්‍රියාවන් / අශුද්ධාත්ම දුරුකිරීම් / මරණින් උත්ථාන කිරීම්
(iv) ජේසුස් වහන්සේ - දේව වචනය අසා ඒවා පිළිපදින සැමදෙනා දේව දරුවන් බව
(v) නාසරත් නුවර ධර්ම දේශනාවේදී - යෙසායා පොත
(vi) දෙමව්පියන්ට කීකරුවීම / මවටත් පියාටත් ගෞරව කිරීම
(vii) දේව සබඳතාවය හා මානව සබඳතාවය වර්ධනය කළ යුතුයි.
(viii) ස්තෙපන් විසින් - ඔහුට ගල්ගසා මරණයට පත්කරන අවස්ථාවේදී
(ix) සමාජයේ යුක්තිය හා සාධාරණත්වය ඇතිකිරීම සඳහා
(x) දිළිඳුකමින් මිදීමට නම් හොඳින් ඉගෙන ගැනීම / විභාගය හොඳින් කරගැනිමට මහන්සි වී පාඩම් කිරීම.
(ලකුණු 2 x 10 = 20)

02 (i) වැඩිහිටියන් ලෙස පිළිගැනීම / දේව මාළිගාවට යාමට අවස්ථාව උදාවීම / ටෝරාව ඉගෙන ගැනීමට අවස්ථාව ලබාදීම (ලකුණු 02)
(ii) දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදවාගෙන මෝසෙස්ගේ නායකත්වය තුළින් කානාන් දේශයට ගෙනඒමේ සිද්ධිය අනුස්මරණය කිරීම (ලකුණු 03)
(iii) * දේව රාජ්‍යයේ මෙහෙවර පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම.
* දෙවියන් වහන්සේ පියාණන් ලෙස පිළිගෙන ක්‍රියා කිරීම.
* මවට, පියාට කීකරුවීම.
* දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා දායකවීම.
* කිතුණු සභාව පවත්වාගෙන යාමට මගපෙන්වීම වැනි සිසුවා ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න.
(ලකුණු 05)

03 (i) අයකැමියන්ගේ ප්‍රධානියකු වීම / අසාධාරණ ලෙස මුදල් ඉපයීම / පමණට වඩා මුදල් උපයා රෝම රජයට ගෙවීම (ලකුණු 02)
(ii) * මිතුරුදම් පාමින් ජේසුස් වහන්සේ ඔහු වෙත ගිය සේක.
* සමාජ තහංචි නොසලකා ඔහුගේ ගැලවීම අපේක්ෂා කළ සේක.
* මොහුත් ආබ්‍රහම්ගේ පුත්‍රයකු යැයි පැවසීමෙන් නැවත යුදෙව් සහෝදරත්වයට යොමු කිරීම අපේක්ෂා කිරීම.
* වැරදිවලින් ගලවා නිවැරදි මඟ, හරිමඟ පෙන්වීම (ලකුණු 03)
(iii) <u>නොමග ගිය අය</u>
මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්
ස්ත්‍රී දූෂණය කරන අය
සොරකම් කරන අය
අන්‍යයන් කරදරයට පත්කරන්නන්
අල්ලස් ගන්නා අය
මොවුන් උදෙසා යාච්ඤා කිරීම
ඔවුන්ගේ වැරදි පෙන්වාදී යහපත් මඟ කියා දීම
මානසිකව පීඩාවට පත්වූවන්ට සහනයට උපදෙස් දීම
භාවනාවට යොමුකිරීම
ජීවිතයේ වටිනාකම් පහදා දීම (ලකුණු 05)

04 (i) ''අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමැත්තෙහුද, ඔබත් ඒ දෙයම ඔවුන්ට කරන්න.'' (ලකුණු 02)
(ii) යහපත වර්ධනය කිරීම / එකිනෙකාට ප්‍රේමයෙන් දිවි ගෙවීම / අන් අයගේ වුවමනා, අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් වීම (ලකුණු 03)
(iii) * නොසැලී ඉදිරියට යාමට දේව වචනය බලයක් වන බව
* මුහුණදෙන්න වන අභියෝග ජය ගැනිමට ශක්තිය ලැබීම
* යැදුම මගින් පීඩාවන්ට මුහුණ දීමට හැකිවීම
* දේව වචනය දිනපතා කියවීමෙන් තම ජීවිතය ආලෝකමත් කරගත හැකිවීම
* සැහැල්ලු සිතක් ඇතිකර ගනිමින් ප්‍රීතියෙන් ජීවිතය ගතකිරීමට හැකිවීම
වැනි සිසුවා ලියා ඇති පිළිතුරුවලට ලකුණු දෙන්න. (ලකුණු 05)

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

05 (i) ව්‍යසන වර්ග 2 කි.
මිනිසා විසින් ඇතිකරගනු ලබන ව්‍යසන
ස්වභාවිකව ඇතිවන ව්‍යසන (ලකුණු 02)

(ii)
* ඇති නැති පරතරය තුළ අධික ධනවත් භාවයෙන් දුප්පතුන් පෙළීම.
* රටක් ලෙස අධික ණය බරින් අන් රටවල් වහලුන් බවට පත්වීම.
* වෙළඳ හා කම්හල් අධිකාරීත්වය තුළ ශ්‍රමය සූරා කෑම නිසා ඇතිවන වහල්භාවය
* ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය තුලින් පවුල් ඒකක තුළ ඇතිවන හිංසනය
(11 ශ්‍රේණිය පෙළ පොත - පිටුව 94) (ලකුණු 03)

(iii)
* ජනතාව අධ්‍යාත්මිකව සැනසීමට ආගමික වැඩ සටහන් ක්‍රියාවට නංවීම.
* දුගී බවින් පෙලෙන පවුල්වලට උපකාර කිරීම.
* රෝගීව සිටින අයවලුන් සඳහා ප්‍රතිකාර කිරීමට උපකාර කිරීම.
* සමාජයේ කාන්තාවන්ට හා දරුවන්ට අවශ්‍ය සහන සැලසීම, කරදරවලින් ඔවුන් මුදාගැනීම.
* ආර්ථිකය යහපත් කර ගැනීමට ස්වයං රැකියා හඳුන්වා දීම (ලකුණු 05)

06 (i) ෆෙස්තුස් රජු / අග්‍රිපා රජු (ලකුණු 02)

(ii) ස්නාවක ජොහාන්ගේ ගෝලයන් හමුවීම, ඔවුන් අත් තැබූ කල ශුද්ධාත්මයාණන් වහන්සේ අත්දැකීම, අන්‍ය භාෂාවලින් කථා කිරීම, ග්‍රීකවරුන්ට දේව වචනය ප්‍රකාශ වීම
අකිලා හා ප්‍රිස්තිලා හමුවීම පිළිබඳ විස්තර කර තිබීම (ලකුණු 03)

(iii) රෝම ගමනේ විශේෂ සිදුවීම් හා සාක්ෂි දැරීම් 5 ක් යටතේ විස්තර කර තිබීම (ලකුණු 05)

07 (i) <u>පෙරමග දූත සේවය</u>
පෙරමග දූතයා ලෙස ස්නාවක ජොහාන් හැඳින්වීම. ඔහු මනස්ථාපනයේ බෞතීස්මය ලබාදීම, ස්නාවක ජොහාන්ගේ මූලික පරමාර්ථය වූයේ ජේසුස් වහන්සේ මෙසියස් වහන්සේ ලෙස පිළිගැනීමට පසුබිම සැකසීම, ඒ සඳහා මිනිස් ජීවිත වෙනසක් කරා යොමු කිරීම. (10 ශ්‍රේණිය පෙළ පොත 21, 22, 23 පිටු)

(ii) <u>වපුරන්නාගේ උපමා කථාව</u>
ශුද්ධවූ බයිබලයේ ශුද්ධවූ ලූක් 8 : 4 - 15
පෙළ පොත 88 - 89 පිටු

(iii) ආමෝස් දිවැසිවරයා
11 ශ්‍රේණිය පෙළ පොත 97, 98, 99 පිටු

(iv) <u>ගරු චන්ද්‍ර ප්‍රනාන්දු පියතුමා</u>
11 ශ්‍රේණිය - පිටු 21 (ලකුණු $5 \times 2 = 10$)